# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1013 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 15/08/2023 පැය 0625

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## මාරක රිය අනතුරක් - මාන්කුලම පොලිස් වසම.

2023.08.15 වන දින අළුයම් කාලයේ මාන්කුලම පොලිස් වසමේ ඒ09 ප්‍රධාන මාර්ගයේ පනිච්චන්කුලම ප්‍රදේශයේදී කොළඹ දෙස සිට යාපනය දෙසට ධාවනය වූ වෑන් රථයක් එම දිශාවට නවතා තිබූ ලොරි රථයක පිටුපස ගැටී ඇති අතර එම ලොරි රථය ඉදිරියෙන් තිබූ තවත් ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත.

පිටුපස ලොරි රථයේ රියදුරු රථයෙන් බැස ලොරි රථ දෙක අතර රැදී සිටියදී සිර වී බරපතල තුවාල ලබා ඇත. එම ලොරි රථයේ පිටුපස සිටි පුද්ගලයෙකු හා වෑන් රථයේ ඉදිරිපස අසුනේ ගමන්ගත් පුද්ගලයෙකුද බරපතල තුවාල ලබා මාන්කුලම රෝහලට ඇතුලත් කිරීමේදී තිදෙනාම මියගොස් ඇත. තවද වෑන් රථයේ ගමන්ගත් කාන්තාවන් තිදෙනෙකු හා ලොරි රථයේ ගමන්ගත් පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු තුවාල ලබා කිළිනොච්චිය රෝහලටද ලොරි රථයේ ගමන් ගත් පිරිමි පුද්ගලයින් තිදෙනෙකු තුවාල ලබා මාන්කුලම රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරුවන් අවුරුදු 38, 46 හා 58 වයස්වල පසු වූ මුල්ලේරියාව නව නගරය, වැල්ලම්පිටිය හා යාපනය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර මාන්කුලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**